www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආර්ථික අර්බුදය හා එක්සත් ජනපදය තුල යලි හිස ඔසවන පන්ති ගැටුම

**The economic crisis and the resurgence of class conflict in the United States**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

**2009 මැයි 19**

*පහත පල වන්නේ "ලෝක ආර්ථික අර්බුදය, ධනවාදයේ අසාර්ථකත්වය සහ සමාජවාදය සඳහා ඉඩ ප්‍රස්ථා" යන මැයෙන් පැවැත්වුනු ලෝසවෙඅ/සසප/සසසජාශි ප්‍රාදේශීය සම්මේලනවලට සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික සභාපති ඩේවිඩ් නෝර්ත් ඉදිරිපත් කල වාර්තාව යි.*

වෝල් වීදියේ ලෙහ්මන් බ්‍රදර්ස් ආයෝජන බැංකුව බිඳ වැටීමත් සමග ඇරඹුනු ලෝක ආර්ථික සහ මූල්‍ය අර්බුදයට දැන් අට මසකට ආසන්න කාලයක් ගෙවී ගොසිනි. 1929 කඩා වැටීමෙන් මෙපිට කාලයෙහි මේ සා දැවැන්ත අර්බුදයක් මින් පෙර හට ගෙන නැත. වත්මන් අර්බුදය "මහා අවපාතය" ඉක්ම යන්නක් විය හැකි යැයි එන්න එන්න ම වැඩි වන ආර්ථික විශ්ලේෂකයෝ සංඛ්‍යාවක් විශ්වාස කරති. මෙම අර්බුදය දිග් ගැස්සෙනු ඇත — මාස ගනනක් නො ව වසර ගනනක් තිස්සේ පවතිනු ඇත — එහි දිගු කාලීන ප්‍රතිවිපාක අතිබලගතු වනු ඇත. ඉතිහාසයේ නව කාල පරිච්ඡේදයක් නිර්මානය වෙමින් පවතියි; මෙම අර්බුදයෙන් මතු වන ලෝකය 2008 සැප්තැම්බර් 15 වන දා ලෙහ්මන් බ්‍රදර්ස් බිඳ වැටීමට පූර්වයෙන් පැවති ලෝකයෙන් අතිශයින් ම වෙනස් වනු ඇත.

ආර්ථික බිඳ වැටීමේ පරිමානය ග්‍රහනය කර ගැනීම ලෙහෙසි නැත. සිය අපරීක්ෂාකාරී ක්‍රියාකාරකම්වලින් ගෝලීය කඩා වැටීමකට මුල පිරූ බැංකු හා මූල්‍ය ආයතනවලට මුක්කු ගැසීම සඳහා එක්සත් ජනපද හා යුරෝපා ආන්ඩු නාස්ති කල තරම් මුදල් සම්භාරයක් — එය ඩොලර් ට්‍රිලියන ගනනකි — සම්බන්ධ වූ කිසිදු පූර්ව සිදුවීමක් ආර්ථික ඉතිහාසයෙහි නැත. අපරාධකාර මහ මොලකාරයෙකු ෆෝර්ට් නොක්ස් ආයතනය සතු රත්රන් තොගය ම සොරා ගැනීමට සමත් වුවත් ඔහුගේ මංකොල්ලයේ වටිනාකම අබල වත්කම් සහන වැඩ සටහන් (ටීඒආර්පී [ටාර්ප්]) යෝජනා ක්‍රමය යටතේ බැංකුවලට පවරා දුන් මුදල් සම්භාරයට වඩා බෙහෙවින් අඩු වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුලට අනුව බැංකුවල අලාභය ඩොලර් ට්‍රිලියන 4ක් පමන ය. ගෝලීය කොටස් වෙලඳ පොලවල සිදු වූ ඩොලර් ට්‍රිලියන 25 සිට ඩොලර් ට්‍රිලියන 30 දක්වා වූ පිරිහීම ද ඇතුලත් කල විට මුලු අලාභය ඩොලර් ට්‍රිලියන 50කට ආසන්න ය.

ගෝලීය ආර්ථික පිරිහීමේ වේගයට පූර්වාදර්ශ නැත. 2008 බිඳ වැටීමෙන් ක්ෂනික ඉක්බිත්තෙහි පැවති තත්ත්වය 1929 එම සමයෙහි පැවති තත්ත්වය සමග සසඳමින් ප්‍රකට අර්ථශාස්ත්‍රඥයන් දෙදෙනකු වන බැරී අයිකන්ග්‍රීන් සහ කෙවින් ඕ'රූර්ක් ප්‍රකාශ කලේ වත්මන් තත්ත්වය වඩා නරක බව යි. 1929 බිඳ වැටීමෙන් පසු එලඹි මාස හය තුල නිෂ්පාදනයේ වැටීම සියයට 5ක් විය; දැන් එය සියයට 12කි. පූර්ව අර්බුදයේ දී වෙලඳාම වැටුනේ සියයට 5කිනි; දැන් එය සියයට 16කින් වැටී ඇත. 1929 අර්බුදය එලඹෙන බව සංඥා කල සිදුවීම වූයේ වෝල් වීදියේ කොටස් මිල ගනන්වල අනපේක්ෂිත වැටීම යි; එහෙත් 2008 වසරේ අවසන් මාසවල දී සහ 2009 වසරේ ආරම්භක මාසවල දී වෙලඳ පොලේ සිදු වූ කඩා වැටීම ඊට වඩා බෙහෙවින් ගැඹුරු ය.

ගෝලීය කාර්මික නිෂ්පාදනයෙහි සිදු වී ඇති බිඳ වැටීමට දෙවන ලෝක යුද්ධය අවසානයෙන් මෙපිට සමය තුල පූර්වාදර්ශ නැත. මාර්තුවේ පටන් මේ දක්වා කාලය තුල යුරෝපා කාර්මික නිෂ්පාදනය වසරකට පෙර පැවති තත්ත්වයේ සිට සියයට 12කින් ඇද වැටී ඇත; බ්‍රසීල කාර්මික නිෂ්පාදනය සියයට 15කින් පහත වැටී තිබේ; තායිවාන කාර්මික නිෂ්පාදනය සියයට 43කින් පහත වැටී ඇත; එක්සත් ජනපදය තුල මේ දක්වා සිදු වී ඇති වැටීම සියයට 11කි. වෙලඳාම ගත් විට, ජර්මානු අපනයන සියයට 20කින් වැටී ඇත; ජපාන අපනයන සියයට 46කින් ද එක්සත් ජනපදයෙහි අපනයන සියයට 23කින් ද පහත වැටී ඇත.

ආර්ථික අර්බුදයේ පරිමානයත් එයින් සමාජය කෙරෙහි ඇති වෙමින් පවතින විනාශකාරී බලපෑමත් පිලිබඳ පැහැදිලි සංඛ්‍යාත්මක ඇඟවුමක් විරැකියාව

සම්බන්ධ දත්ත මගින් සම්පාදනය වේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (අයිඑල්ඕ) *2009 Global Trends* (*2009 ගෝලීය ප්‍රවනතා*) නම් වාර්තාව බියකරු පාඨාංක ඉදිරිපත් කරයි. 2008 දී කලින් වසරට වඩා විරැකියාව මිලියන 10.7කින් ඉහල ගියේ ය. එය 1998 ආසියානු මූල්‍ය අර්බුදයෙන් මෙපිට සිදු වූ විශාලතම ඉහල යාම යි. ගෝලීය රැකියා විරහිතයන්ගේ මුලු ගනන මිලියන 190 කට ලඟා විය. ඉන් මිලියන 109ක් පිරිමින් වූ අතර මිලියන 81ක් ගැහැනු වූහ. විරැකියාවෙන් පෙලෙන තරුනයන් සංඛ්‍යාව මිලියන 76ට ලඟා විය.

2009 වසරෙහි විරැකියාව පිලිබඳ අයිඑල්ඕ පුරෝකථන අර්බුදය පිලිබඳ එකිනෙකට වෙනස් උපකල්පන තුනක් මත පදනම් වේ. වඩාත් ම විය හැකි යැයි අයිඑල්ඕව මත් විශ්වාස තබන්නේ විරැකියන්ගේ සංඛ්‍යාව මිලියන 30ත් 50ත් අතර සංඛ්‍යාවක් දක්වා ඉහල නැගෙනු ඇති බවය. සැබෑ සංඛ්‍යාව වැඩි අගය දක්වා ලඟා විය හැකි ය.

අයිඑල්ඕව පවසන පරිදි ඌන සංවර්ධිත රටවල දරිද්‍රතා කඩඉම දිනකට ඩොලර් 2ක ආදායමකි. එහෙත් අන්ත දරිද්‍රතාවේ දී එය දිනකට ඩොලර් 1.25කි. ඒ අනුව දරුනු ආර්ථික අර්බුදයකින් අන්ත දරිද්‍රතාවෙහි දිවි ගෙවන තවත් කම්කරුවන් මිලියන 200ක් නිර්මානය වනු ඇතැයි සංවිධානය පුරෝකථනය කරයි. අයිඑල්ඕව සලකුනු කර ගන්නා තවත් අර්ථභාරී ප්‍රවර්ගයක් නම් පීඩාවට ගොදුරු විය හැකි තත්ත්වයෙන් රැකියාවල නියුක්ත කෙරුනු අය — එනම් අතිශයින් ම පහල වැටුප්, නින්දා සහගත සේවා කොන්දේසි සහ නො ගිනිය හැකි තරමේ වූ අවස්ථාවන් ඉවසා දරා ගෙන සිටින කම්කරුවන් ය. අයිඑල්ඕවට අනුව එවැනි කම්කරුවන්ගේ සංඛ්‍යාව 2008 දී මිලියන 84කින් ඉහල නැගී මුලු ගනන බිලියන 1.6ක් දක්වා වර්ධනය වේය.

ඌන සංවර්ධිත කලාපවල සමාජ තත්ත්වය දැනට මත් අතිශයින් ම ව්‍යසනකාරීව පවත්නා තතු තුල දියුනු ධනපති රටවල දී ආර්ථික අර්බුදය කම්කරු පන්තිය මත විනාශකාරී බලපෑමක් ඇති කරමින් තිබේ. පොහොසත් ම රටවල් 30 තුල දී ආර්ථික අර්බුදය රැකියා විරහිතයන්ගේ සංඛ්‍යාව මිලියන 25කින් ඉහල නංවනු ඇත.

එක්සත් ජනපදයෙහි තත්ත්වය දිගින් දිගට ම නරක අතට හැරෙයි. අප්‍රේල් මාසයේ දී තවත් පුද්ගලයන් 563,000කට රැකියා අහිමි වූ අතර ජාතික විරැකියා අනුපාතය සියයට 8.9ට ඉහල නැගින. රැකියානැති සමස්ත කම්කරු සංඛ්‍යාව දැන් මිලියන 13.7කි. මෙය පශ්චාත් දෙවන ලෝක යුද්ධ සමයෙහි පැවති ඉහල ම අගය යි. ආර්ථික අර්බුදයේ පහර එල්ල වන්නට පටන් ගත් තැන් පටන් කම්කරුවන් 6,000,000ක් සිය රැකියාවලින් ඉවත් කරනු ලැබ තිබේ. මාර්තුවේ දී, කැලිෆෝනියාවෙහි 62,000කින් ද ෆ්ලොරිඩාවෙහි 51,000කින් ද ටෙක්සාස්හි 47,000කින් ද උතුරු කැරොලිනාවෙහි 41,000කින් ද ඉලිනොයිස්හි 39,000කින් සහ ඔහියෝවේ 37,000කින් ද විරැකියාව ඉහල ගියේ ය. ඉහල ම කලාපීය විරැකියා අනුපාතය ඇත්තේ බටහිර වන අතර දැන් එය සියයට 9.8කි. මිඩ්වෙස්ට් කලාපයෙහි එය සියයට 9.0කි.

ප්‍රාන්ත මට්ටමේ දී (මාර්තුවේ සිට) සියයට 12.6ක්ව තිබෙන මිචිගන්හි විරැකියා අනුපාතය රටෙහි පවතින ඉහල ම අනුපාතය යි. දෙවන ස්ථානයෙහි පවතින ඔරිගන්හි කම්කරුවන්ගෙන් සියයට 12.1කට රැකියා නැත. දකුනු කැරොලිනාවෙහි කම්කරුවන්ගෙන් සියයට 11.4කට ද කැලිෆෝනියාවෙහි සියයට 11.2කට ද උතුරු කැරොලිනාවෙහි සියයට 10.8කට ද රෝඩ් අයිලන්ඩ්හි සියයට 10.5කට ද නෙවාඩාහි සියයට 10.4කට සහ ඉන්ඩියානාහි සියයට 10කට ද රැකියා නැත.

මෙම විරැකියා මට්ටම් අන්ත සමාජ දරිද්‍රතාව පිලිබඳ වෙනත් දර්ශක බවට පරිවර්තනය වෙමින් තිබේ: එනම් පෙරවරනවලින් (උකස්කරයන් නිදහස් කර ගැනීම තහනම් කිරීම්වලින්) හා පුද්ගල බංකොලොත් වීම්වලින් හට ගත් මහා කලබැගෑනිය, පාසල්වලට ඇතුලත් කර ගැනීම් පහත වැටීම, අපරාධ අනුපාතය ඉහල යාම සහ පොදුවේ ජනගහනයේ සෞඛ්‍යය සහ යහපැවැත්ම නරක අතට හැරීම යි. ජීවන තත්ත්වයන් සෝදාපාලු කරමින් සහ මිලියන සංඛ්‍යාත කම්කරුවන් මූල්‍ය ව්‍යසනයක අද්දරට ම තල්ලු කර දමමින් රට පුරා සිටින කම්කරුවන් මත සියයට 10ක සහ ඊට වඩා වැඩි මට්ටම්වල වැටුප් කප්පාදු පටවා ඇත.

එසේ නම් අනාගතය පිලිබඳ පුරෝකථනය කුමක් ද? "පත්ලට" ලඟා වී "පොලා පැනීම" ඇරඹෙනු ඇත්තේ කුමන මොහොතක දී ද? ගෝලීය වෙලඳ පොලවල මාර්තුවේ සිදු වූ පහල බැසීම්වලින් පසුව මෑතක දී සිදු වූ ඉහල නැගීම නව යුගයක ආරම්භය යැයි ප්‍රකාශ වේ. බැංකු පද්ධතියට ඩොලර් මිලියන ගනනින් රජයේ මුදල් පොම්ප කිරීම්වලින් සෘජු බලපෑමක් ඇති වූ බව සැබෑ ය. එහෙත් පසුබැසීම ඉතා ලඟ දී ම අවසන් වීමක් ගැන ඉදිරිපත් වූ නානාවිධ සර්වශුභවාදී පුරෝකථන සනාථ කරන ස්ථාවර දත්ත පවතින්නේ ස්වල්පයකි. රැකියා නියුක්තිය පිලිබඳ මෑත ම එක්සත් ජනපද සංඛ්‍යා ලේඛනවලින්, රැකියා අහිමි වීම් පිලිබඳ සැර බාල අනුපාතයකට වඩා බලාපොරොත්තු සහගත වූ කිසිවක් නොපෙන්වුනු බව අපි සිහි තබා ගනිමු. එය කිසි සේත් ම සුභාරංචියක් නො වේ. එමෙන් ම ලඟ දී ම සිදු වන "පොලා පැනීමක්" පිලිබඳ සමපේක්ෂනයෙන් පිලිබිඹු වන්නේ වර්තමාන අර්බුදය පිලිබඳ සාවද්‍ය අවබෝධයකි. සැබවින් ම යම් මොහොතක දී තත්ත්වයේ වැඩි දියුනු වීමක් සිදු වීමට තිබෙන ඉඩකඩ මුලුමනින් ම බැහැර

වී නැත. එහෙත් ආර්ථික තත්ත්වය අඛන්ඩව පිරිහෙනු ඇතැයි සිතීම ද දුෂ්කර නො වේ.

කෙසේ වුව ද ගෝලීය ආර්ථිකයේ වෙලඳ පොලවල සහ වෙනත් දර්ශකවල සිදු වන කෙටි කාලීන උච්චාවචනයන් මොන මොනවා වුවත් කලින් පැවති තත්ත්වය කරා ආපසු යාමක් නම් සිදු වනු නැත; කලින් පැවති කොන්දේසි අහෝසි වී ගොස් ඇති අතර ඒවා ආපසු එනු ඇත. මෙසේ වන්නේ ගෝලීය මූල්‍යකරන පද්ධතියට සිදු වී ඇති දැවැන්ත හානිය නිසා පමනක් නො වේ. මෙම අර්බුදයෙන් සනිටුහන් වන්නේ දෙවන ලෝක යුද්ධයෙන් උපන් ලෝක ධනවාදයේ ගෝලීය ව්‍යුහයෙහි කඩා වැටීම යි. වත්මන් අර්බුදය එක්සත් ජනපදයෙහි උපත ලැබීම අහම්බෙන් සිදු වූවක් නො වේ. එක්සත් ජනපද අධිපති ගෝලීය ආර්ථික තත්ත්වය දිගුකලක් තිස්සේ පිරිහී යාමේ ප්‍රතිඵලය ලෙස එය නැගී ආවේය යන කාරනය තුල මෙම අර්බුදයේ සාරභූත අර්ථභාරය නිශ්චිතව ම පිහිටා තිබේ.

මෙම අර්බුදය යනු ඇමරිකානු සහ ගෝලීය ආර්ථිකයේ ද එය පදනම් වී ඇති සමාජ සහ පන්ති සබඳතාවල ද මූලික ප්‍රතිව්‍යුහගත වීමක් සිදු වෙමින් පවත්නා රූපාකාරය යි. එය විසඳිය හැකි වන්නේ දෙයාකාරයකින් එකකින් පමනකිඃ එක්කෝ ධනවාදී පදනමක් මත ය, නැත් නම් සමාජවාදී පදනමක් මත ය. පලමු වැන්න එනම් ධනවාදී විසඳුම එක්සත් ජනපදයේ, යුරෝපයේ සහ ලෝකය පුරා කම්කරු පන්තියෙහි ජීවන තත්ත්වයන්ගේ උග්‍ර පහත වැටීමක් අදහස් කෙරෙනු ඇත. මෙම විසඳුම, දැවැන්ත අභ්‍යන්තර මර්දනයක් ද කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් විනාශ කිරීමක් ද දෙවන ලෝක යුද්ධයෙන් මෙපිට කාලයෙහි නොඅත්දුටු පරිමානයකින් මිලිටරිමය ප්‍රචන්ඩත්වය මුදා හැරීමක් ද ඉල්ලා සිටිනු ඇත.

මහා ව්‍යසනයක් පිලිබඳ මෙම උපකල්පනයට ඇති එක ම විකල්පය වන්නේ සමාජවාදී විසඳුම යි. ඒ සඳහා ඇමරිකානු සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය දේශපාලන බලය අල්ලා ගැනීමත් කාර්මික, මූල්‍ය සහ ස්වාභාවික සම්පත් මහජන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට නතු කිරීම සහ විනාශකාරී ලෙස ලාභය සහ පෞද්ගලික ධන සම්පත් හඹා යාම වෙනුවට සමස්ත සමාජයේ ම අවශ්‍යතාවන් තෘප්තිමත් කිරීමට කැප වුනු විද්‍යාත්මකව සැලසුම් කෙරුනු ගෝලීය ආර්ථිකයක් වර්ධනය කිරීමත් අවශ්‍ය ය.

ඇමරිකාවෙන් අනුප්‍රානය ලැබ පසු ගිය 30 වසර තිස්සේ විකාශනය වී ආ "නිදහස් වෙලඳ පොල" ධනවාදය මත පදනම් වූ ලෝක ධනවාදී පද්ධතියේ දූෂිත සහ පරපෝෂිත ස්වභාවය අර්බුදයෙන් එලිදරව් වී ඇත. දැන් පැහැදිලි වී ඇති පරිදි සමාජයේ කුඩා කොටසක් අතිමහත් ලෙස ධනවත් වීම සහ සමාජ අසමානතාව පෙර නොවූ විරූ අයුරින් වර්ධනය වීම වනාහි දූෂිත සහ ගිලන් වූ පද්ධතියක ලක්ෂන විය. ඇස් නිලංකාර කරන මෙම අර්බුදයේ එලියෙන් එන්න එන්න ම වැඩි වන ආර්ථික ප්‍රකාශකයන් සංඛ්‍යාවක් ඒත්තු ගනිමින් සිටින්නේ වත්මන් අර්බුදයට තුඩු දුන් පිලිවෙත් සහ භාවිතයන්හි මුල් සොයා 1979 දී මාගරට් තැචර් බලයට පත් වීම සහ 1980 දී රොනල්ඩ් රේගන් තේරී පත් වීම තෙක් ආ පස්සට යා හැකි බව යි. ඔවුන් දෙදෙනාගේ ජයග්‍රහනය ජෝන් මේනාර්ඩ් කේන්ස්ගේ පාලිත ධනවාදය ප්‍රතික්ෂේප කිරීමකටත් මිල්ටන් ෆ්‍රීඩ්මාන්ගේ නිදහස් වෙලඳ පොල "මූලධර්මවාදය" හඳුන්වා දීමටත් හේතු විය.


මෙම විශ්ලේෂනය තුල සත්‍යයේ අංශු මාත්‍රයක් පවතින මුත් එය වඩා මූලික ප්‍රශ්නයෙන් කර අරියිඃ එනම් මෙම වෙනස් වීම සිදු වූයේ ඇයි ද යන්න යි. කේන්ස්වාදයේ සිට ෆ්‍රීඩ්මාන්වාදී නිදහස් වෙලඳ පොල මූලධර්මවාදයට මාරු වීම වනාහි බ්‍රිතාන්‍යයෙහි සහ එක්සත් ජනපදයෙහි පාලක පන්තියේ බලගතු කොටස් විසින් ඒ වන විටත් බොහෝ දුරදිගට වර්ධනය වී තිබූ ධනවාදී පද්ධතියේ අර්බුදයට දක්වන ලද ප්‍රතිචාරයක් විය. දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිතිව එලඹුනු කාලයෙහි ධනවාදය තහවුරු කිරීම සහ යලි ගොඩ නැගීම සඳහා කේන්ස් නිපදවා ගත් යන්ත්‍රනයන් බිඳ වැටෙමින් තිබෙන බවට ඇඟවුම් 1967 තරම් ඈත දී ම දැකගත හැකිව තිබුනි. පශ්චාත් යුද්ධ ආර්ථික ප්‍රසාරනය සඳහා පදනම සැපයූ ස්ථාවර ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය ස්ථාපනය කල 1944 බ්‍රෙට්න් වුඩ්ස් සම්මේලනයේ දී සම්මත කර ගත් ඩොලර්-රන් පරිවර්ත්‍යතා පද්ධතිය, 1960 ගනන්වල අග දී වැඩි වැඩියෙන් දුස්සාධ්‍ය තත්ත්වයට පත් විය. 1971 අගෝස්තු 1 වන දා ජනාධිපති රිචඩ් නික්සන් ඩොලර්-රන් පරිවර්ත්‍යතාව අවසන් කල කල්හි පද්ධතිය මුලුමනින් ම බිඳ වැටින.

බ්‍රෙට්න් වුඩ්ස් පද්ධතිය බිඳ වැටීමට අන්තර් සම්බන්ධිත සාධක තුනක් දායක විය. පලමු වැන්න, 1950 හා 1960 ගනන්වල දෙවන ලෝක යුද්ධයෙන් පසු කාල පරිච්ඡේදයෙහි එක්සත් ජනපදය භුක්ති විඳි අධිපති ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් ඛාදනය වී යාම යි. දෙවැන්න, ඇමරිකානු, යුරෝපා සහ ජපාන සංගත මත සැලකිය යුතු පීඩනයක් පතිත කරමින් සහ ගෝලීය තරගකාරී භාවයෙහි පීඩනයන් තීව්‍ර කරමින් 1960 ගනන්වල මැද දී පොදුවේ ලාභ අනුපාතය පිරිහී යාම යි. අවසානයේ දී ලෝකයේ සිව්දිගින් මතු වී ආ කම්කරු පන්ති සටන්කාමිත්වය කම්කරු පන්තිය සූරා කෑම උග්‍ර කිරීම මගින් අර්බුදයෙන් ගැලවීමේ මගක් සොයා ගැනීම සඳහා ධනපති පන්තිය දැරූ ප්‍රයත්න ව්‍යර්ථ කර දැමී ය.

1967 සහ 1975 අතර කාල පරිච්ඡේදය අංගලක්ෂිත වූයේ ජාත්‍යන්තර පරිමානව කම්කරු පන්ති

සටන්කාමිත්වය සහ දේශපාලන රැඩිකලීකරනය පුපුරා යාමක් මගින්ය. 1968 ප්‍රන්සයේ මැයි-ජූනි මහා වර්ජනය, 1969 දී ඉතාලියෙහි පැන නැගි දැවැන්ත වැඩ වර්ජන රැල්ල, දකුනු ඇමරිකාවෙහි සිදු වූ කම්කරු පන්ති නැගිටීම, අවසානයේ දී දක්ෂිනාංශක කොන්සර්වටිව් ආන්ඩුව බලයෙන් පහකිරීමට තුඩුදෙමින් ආකර කම්කරුවන් පෙරමුන ගෙන බ්‍රිතාන්‍යයෙහි මතු වී ආ බලගතු වැඩ වර්ජන, පෝලන්තයෙහි ස්ටැලින්වාදී පාලන තන්ත්‍රය සැලුම් වෙවුලුම් ගන්වමින් ග්ඩාන්ස්ක්හි පැන නැගි නැව් තටාකාංගන කම්කරුවන්ගේ වැඩ වර්ජන, අවසානයේ තම රටවල පැවති ආඥාදායකත්වයන් කුඩු පට්ටම් කරමින් ඉස්මත්තට ආ ග්‍රීක, පෘතුගාල සහ ස්පාඤ්ඤ කම්කරුවන්ගේ ප්‍රතිරෝධය යන මේවා විප්ලවවාදී මානයක් අත් කර ගත් ගෝලීය කම්කරු සටන්කාමිත්වයේ රැල්ලක වඩාත් ම අර්ථභාරී ප්‍රකාශන අතර විය. මෙම ව්‍යාපාරය ප්‍රධාන ධනවාදී මධ්‍යස්ථානවලින් ඔබ්බට ද පැතිරී ගියේ ය. අප්‍රිකාව, මැද පෙරදිග, ලතින් ඇමරිකාව සහ ආසියාව පුරා මහා ජනකායන් ඇමරිකානු සහ යුරෝපා විජිතවාදයේ ඉතිරිපහදු වී තිබූ ලේශමාත්‍රයන් මුලිනුපුටා දැමීම ඉලක්ක කර ගත් මහජන අරගලවලට ඇද ගැනුනේය. මෙම ලෝක පරිමාන ව්‍යාපාරයේ වඩාත් ම වික්‍රමාන්විත ප්‍රකාශනය වූවේ වියට්නාම මහජනතාවගේ අරගලය යි.

මෙම ගෝලීය ක්‍රියා දාමයේ දී එක්සත් ජනපදයේ කම්කරු පන්තිය අර්ථභාරී භූමිකාවක් ඉටු කලේ ය. සාරය වශයෙන් ගත් කල 1950 සහ 1960 ගනන්වල දී ඇමරිකානු සමාජය දෙදරුම් කැවූ සිවිල් අයිතීන් සඳහා වූ ඓතිහාසික අරගලය — සාරය වශයෙන් ගත් කල්හි — අවසන් විග්‍රහයේ දී ඇමරිකානු සමාජයේ පන්ති ව්‍යුහයෙහි මුල් බැස තිබූ පීඩනයට සහ වෙනස්කම් කිරීමට එරෙහිව ඇමරිකානු කම්කරු පන්තියේ වඩාත් ම සූරා කෑමට ලක් වූ සහ දිලිඳු භාවයට පත් වූ කොටස් විසින් කරන ලද අරගලයක් විය. ලොස් ඇන්ජලීස්, නෙවාර්ක් සහ ඩෙට්‍රොයිට් වැනි නගරවල දී මෙම අරගල කැරැල්ලක රූපාකාරය අත් කර ගත්තේ ය. ප්‍රාන්ත ආන්ඩු සිය ප්‍රාදේශීය ආරක්ෂක භටයන් බලමුලු ගන්වමින් ද යුද නීතිය පනවමින් ද ප්‍රතිචාර දැක්වී ය. ඩෙට්‍රොයිට්හි මහජන කැරැල්ල මර්දනය කිරීම සඳහා ජනාධිපති ලින්ඩන් ජොන්සන් මධ්‍යම ආන්ඩුවේ භට කන්ඩායම් පිටත් කර යැවී ය.




**කම්කරුවන් 1000 හෝ ඊට වැඩියෙන් සම්බන්ධවූ වැඩ නැවැත්වීම් වලින් අහිමිවූ මිනිස් දින 1947-2008**

1960 ගනන්වල මැද භාගයේ පටන් කාර්මික කම්කරු පන්තියේ පුලුල් කොටසක් අතර — පන්ති සටන්කාමිත්වයේ වඩාත් ම මූලික ප්‍රකාශනය වන — වැඩ වර්ජන ක්‍රියාව විස්මිත ලෙස වැඩි වර්ධනය විය. 1930 සහ 1940 ගනන් අග භාගයේ හට ගත් කලහකාරී අරගලවලින් පසුව 1950 දී සහ 1960 ගනන්වල මුල දී වර්ජනවල ක්‍රමානුකූල පහත වැටීමක් පැවතුනි. මින් බැහැර වූයේ 1959 වසර පමනකි; වානේ කම්කරුවන් ලක්ෂ ගනනක් සම්බන්ධවූ දින 116ක් පුරා පැතිර ගිය ප්‍රචන්ඩ වර්ජනය නිසා අහිමි වූ නිෂ්පාදන කාලය හේතු කොට ගෙන වානේ සමාගම්වලට මිනිස් දින මිලියන ගනනක පාඩුවක් සිදුකලේය. 1960 සහ 1966 අතරතුර දී වර්ජනවල ප්‍රතිඵල වශයෙන් අහිමි වූ වාර්ෂික මිනිස් දින ගනන මිලියන 10ත් 16ත් අතර දෝලනය විය. 1967 දී වැඩ නැවැත්වීම්වලින් සේව්‍යපක්ෂයට මිනිස් දින මිලියන 31ක පාඩුවක් පැමිනවුනු විට තත්ත්වය මුලුමනින් ම වෙනස් විය. 1968 දී සංඛ්‍යාව මිනිස් දින මිලියන 35ක් දක්වා ඉහල ගියේ ය. 1969 දී මිනිස් දින මිලියන 29ක් දක්වා එය යන්තමින් ලුහුටා ගියේ ය. 1970 දී වැඩ නැවැත්වීම් නිසා අහිමි වූ මුලු මිනිස් දින ගනන මිලියන 52.7ට නැග්ගේ ය. ඒ ජෙනරල් මෝටර්ස් ආයතනයට එරෙහිව දෙමසක් පුරා විහිද ගිය මෝටර් රථ කම්කරු වර්ජනය පැන නැගි වසර යි. එමෙන් ම එය ප්‍රාදේශීය ආරක්ෂක භටයන් කෙන්ට් ප්‍රාන්ත විශ්ව විද්‍යාල සිසුන් හතර දෙනෙකු කෲර ලෙස ඝාතනය කල වසර ද විය.

1972 දී සහ 1973 දී අහිමි වූ වැඩ දින සංඛ්‍යාව මිලියන 16ක් පමන වන තෙක් වර්ජන මට්ටම පහත වැටින. ඒ වනාහි වැටුප් ඉල්ලීම් මැඩ පැවැත්වීම සඳහා පිහිටුවනුලැබූ ආන්ඩුව-කලමනාකරනය- සහ කම්කරුවන්ගේ කමිටුවක් තුල ඒඑෆ්එල්-සීඅයිඕ, ටීම්ස්ටර්ස් සහ යූඒඩබ්ලිව් වෘත්තීය සමිති සහයෝගී වීමෙන් ඇති කල විශාල වැඩ පිලිවෙලක ප්‍රතිඵලයකි.

එහෙත් 1974 දී සටන්කාමී ආකර කම්කරුවන්ගේ මූලිකත්වයෙන් සිදු වූ වැඩ නැවැත්වීම්වල ප්‍රතිඵල වශයෙන් මිලියන 32කට ආසන්න මිනිස් දින ගනනක් අහිමි කලේය. 1975 දී වර්ජන මට්ටම මිනිස් දින මිලියන 17.5ක් දක්වා ලුහුටා ගියේ ය. කෙසේ වුව ද දශකයේ ඉතිරි කාල පරිච්ඡේදය තුල 1976 සිට 1980 දක්වා වර්ජනවලින් සේව්‍යයන්ට මිනිස් දින මිලියන 20ත් 23ත් අතර පාඩුවක් සිදුවිය.

මෙම සංඛ්‍යා 1970 ගනන් පුරා දක්නට ලැබුනු කම්කරු පන්තියේ ඉමහත් සටන්කාමිත්වයට දෙස් දෙයි. පන්ති සටන්කාමිත්වයේ ඉහල ම ලක්ෂ්‍යය වූයේ 1977-78 ජාතික පතල් කම්කරු වර්ජනය යි. වර්ජකයෝ වෘත්තීය සමිති නිලධරයන් කතිකා කර ගත් පාවා දීමේ ගිවිසුම් දෙකක් ප්‍රතික්ෂේප කරමින් කුප්‍රකට ටැෆ්ට්-හාර්ට්ලි පනතේ විධිවිධාන යටතේ ජනාධිපති ජිමී කාටර් නිකුත් කල ආපසු වැඩට යාමේ නියෝගයට එලිපිට ම විරෝධය පෑහ.

පසු ගිය 30 වසර පුරා ඇමරිකානු සමාජය තුල සිදු වී ඇති වෙනස්කම් වටහා ගනු පිනිස මෙම ඉතිහාසය පිලිබඳ සමාලෝචනයක් කිරීම අත්‍යවශ්‍ය ය. මෙම වසර, කම්කරු පන්තියට එරෙහිව පාලක පන්තිය එල්ල කල කුරිරු ප්‍රතිප්‍රහාරයක ආරම්භය සංඥා කල සිදුවීම් තුනක, 30 වන සංවත්සරය සනිටුහන් කරයි. මෙම ප්‍රතිප්‍රහාරය සඳහා කොන්දේසි නිර්මානය වූයේ කම්කරු පන්තියේ සටන්කාමිත්වය තිබියේ වුව ද 1960 ගනන්වල සහ 1970 ගනන්වල අරගල කිසිදු ස්වාධීන දේශපාලන ඉදිරි දර්ශනයකින් තොර වීමේ කාරනයෙනි. වෘත්තීය සමිති නිලධරය ඩිමොක්‍රැටික් පක්ෂය සමග සන්ධානගත වීම මගින් මහජන ව්‍යාපාරය, ධනවාදී දේශපාලනය සහ ධනවාදී ආර්ථික විද්‍යාව තුල සිර කොට විලංගු ලී ය. වෙනත් වචනවලින් කිව හොත් කලින් දශකවල දී තමන් ලත් පරාජයන් ආ පස්සට හරවා ප්‍රහාරයට යාමට පාලක පන්තියට අවස්ථාව සැපයුනු ආවෘත අන්තයක් කරා ව්‍යාපාරය අවසානයේ සේන්දු විය.

ප්‍රතිප්‍රහාරය ඇරඹුනේ ඩිමොක්‍රැටික් ජනාධිපති ජිමී කාටර් ෆෙඩරල් රිසර්ව් බැංකුවේ සභාපති ලෙස පෝල් වෝකර් පත් කිරීමත් සමගිනි. ඔහු පත් කිරීම " රැකියාවලට සහ කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන්ට එරෙහි යුද්ධ ප්‍රකාශ කිරීමක්" හඟවති යි *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පෙරගමන්කරු වූ බුලටින්* පුවත්පත 1979 ජුලි 27 වන දා අනතුරු ඇඟවී ය. මෙම විශ්ලේෂනය ඉක්මනින් ම සනාථ විය. පොලී අනුපාත පෙර නොවූ විරූ මට්ටම්වලට ඉහල නංවමින් ද ඒ අනුව දරුනු පසුබෑසීමක් ඇති කරමින් සහ විරැකියාව ඉහල නංවමින් ද වෝකර් වහා ම කම්කරු පන්තියේ කොන්ද බිඳීමේ වැඩ ආරම්භ කලේය. වෝකර් යටතේ මූලික පොලී අනුපාතය අවසානයේ සියයට 21.5ක් තරම් ඉහල ගියේ ය.

දෙවන සිදුවීම වූයේ ඩෙට්‍රොයිට්හි පිහිටි ප්‍රධාන නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් වූ කම්කරුවන් කිහිප දහසක් සේවයෙහි යෙදුනු හැම්ට්‍රැම්ක්හි පිහිටි කීර්තිමත් ඩොජ් මේන් කර්මාන්ත ශාලාව වසා දමන බවට ක්‍රයිස්ලර් සමාගම නිවේදනය කිරීම යි. රැකියා ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලෙස එහි සේවය කල කම්කරුවන්ගෙන් ඉදිරිපත් වූ ඉල්ලීම් නො තකා හල යූඒඩබ්ලිව් සමිතිය කම්හල් හිමියන්ගේ තීන්දුව පිලිගත්තේ ය. විරුද්ධත්වයේ ගෙල සිර කරනු ලැබ ප්‍රතිරෝධයකින් තොරව ම කම්හල වසා දැමින.

අවසානයේ ක්‍රයිස්ලර් සමාගමට වැටුප් සහ වැඩ කොන්දේසි පිලිබඳ ප්‍රධාන ගනයේ සහන ප්‍රදානය කිරීමට යූඒඩබ්ලිව් නිලධරය තීන්දු කලේ ය. මෙය ඇරඹුනේ තදනන්තරව ඇමරිකානු කම්කරු පන්තියේ සියලු කොටස්වල රැකියා, වැටුප්, වැඩ කොන්දේසි සහ ප්‍රතිලාභ මත එල්ල වූ ප්‍රහාරවලට මග හෙලි පෙහෙලි කල සමිති-කලමනාකරන සහයෝගිතා රටාවකිනි. මේ සියලු සිදුවීම් සිදු වූයේ රේගන් ජනාධිපතිවරයා ලෙස තේරී පත් වන්නට පෙර ය. 1981 ජනවාරියේ දී ඔහු ජනාධිපති තනතුරට පත් වීම 1979 දී කාටර් අරඹා තිබූ කම්කරු පන්තියට එරෙහි යුද්ධය වේගවත් ද තීව්‍ර ද කලේ ය. රේගන් ජනාධිපතිත්වයේ සීමාමායිම් පැහැදිලි කල සිදුවීමෙන් — එනම් පැට්කෝ වෘත්තීය සමිතියේ සාමාජික වර්ජිත ගුවන් ගමන් පාලකයන් 11,000ක් සිය රැකියාවලින් නෙරපා දැමීම — වර්ජන බිඳීම සහ වෘත්තීය සමිති සුනු විසුනු කිරීම නීත්‍යානුකූල බවටත් ඊට ආන්ඩුවේ සහාය ලැබෙනු ඇති බවටත් සියලු සංගතවලට සංඥාවක් යැවින. කෙසේ වුව ද ගොදුරක් බවට පත් වූ ගුවන් ගමන් පාලකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කිසිදු පියවරක් ගැනීමට විරුද්ධ වූ ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරය ලබාදුන් සහාය නොතිබෙන්නට පැට්කෝ විනාශ කිරීමේ රේගන්ගේ උත්සාහය පල නොදරනු ඇත.

ඉන් පසුව එලඹි වසරවල දී ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරය ආන්ඩුවේ හා ව්‍යාපාරවල වැඩ වර්ජන කැඩීමේ රැල්ලකට සහයෝගය දුන්හ. 1980 ගනන් වර්ජනවලින් හිඟ වූයේ නොවේ — ග්‍රේහවුන්ඩ් බස් රථ රියැදුරන්ගේ, කන්ටිනෙන්ටල් ගුවන් සේවා නියමුවන්ගේ, පෙල්ප්ස් ඩොජ් තඹ ආකර කම්කරුවන්ගේ, හෝර්මල් මස් ඇසුරුම් කම්කරුවන්ගේ සහ ඒ.ටී. මැසී ගල් අඟුරු ආකර කම්කරුවන්ගේ අරගල 1980 ගනන් වල එවන් ප්‍රකට අරගලවලින් කිහිපයකි. එනමුත් ඒඑෆ්එල්-සීඅයිඕව මේවා ද අනෙක් සෑම වර්ජනයක් ම ද හුදෙකලා කර පරාජය කලේ ය. හෝර්මල් වර්ජනයේ දී එක්සත් ආහාර සහ වානිජ

කම්කරු සංගමය වර්ජනයේ මර්මස්ථානයේ පිහිටි සිය ප්‍රාදේශීය ශාඛාව අහෝසි කර දැමී ය.

ඔවුන් ආන්ඩුව සමග සහයෝගී වෙද්දී ඩිමොක්‍රැටික් පක්ෂය සහ මහ ව්‍යාපාරිකයෝ වර්ජන කුඩු පට්ටම් කිරීමෙහි යෙදී ගත්හ. සමිති-කලමනාකරන සහයෝගිතාව පිලිගත් — 1920 ගනන්වල දී සහ 1930 ගනන්වල දී ෆැසිස්ට් ඉතාලියෙහි සහ නාසි ජර්මනියෙහි පිහිටුවුනු කම්කරු-ව්‍යාපාරික පාලක මන්ඩල ආදර්ශයට ගත් — පාවාදීම පැහැදිලිව ම සංගතවාදී වූ සබඳතාවලට වෘත්තීය සමිති නායකත්වය පිවිසී ගත්තේ ය. සිය සංගතවාදී දෘෂ්ටිවාදය සංකේතවත් කල එක් ක්‍රියාවක දී යූඒඩබ්ලිව් සමිතිය "යූඒඩබ්ලිව්-ජීඑම්," "යූඒඩබ්ලිව්-ක්‍රයිස්ලර්," "යූඒඩබ්ලිව්-ෆෝර්ඩ්" වශයෙන් සිය නාමයත් මහා මෝටර් රථ සමාගම් තුනක නාමයනුත් එකට යා කරන දම්වැලක් යෙදීමේ ව්‍යායාමයට සහාය දැක්වීය.

කඩාකප්පල් කිරීම්වලින් සමන්විත වූ දශකයකින් පසුව ඒඑෆ්එල්-සීඅයිඕ, යූඒඩබ්ලිව් සහ ටීම්ස්ටර්ස් යන සමිති වෘත්තීය සමිති වූයේ නමින් පමනකි. කම්කරු පන්තිය ආරක්ෂා කිරීම සමග මොන යම් හෝ සම්බන්ධයක් සහිත සංවිධාන ලෙස පැවතීම ඔවුන් නවතා දමා තිබුනේය. ඒ වෙනුවට සංගත වෙනුවෙන් සහ සංගත සමග සහයෝගීව කම්කරුවන් පාලනය කරමින් ඔවුහු දක්ෂිනාංශික නිලධරයන්ගෙන් සැදුම් ලත් ඉහල මධ්‍යම පන්තික ස්තරයක මූල්‍යමය සහ සමාජ අවශ්‍යතාවන්ට සේවය කලහ.

සංගත-පාලිත සමිතිවලින් කම්කරු පන්තිය මත එල්ල වූ බලපෑම පිලිබඳ වඩාත් ම සිත් ගන්නාසුලු සංඛ්‍යාතිමය සාක්ෂ්‍යය වන්නේ එක්සත් ජනපදය තුල වැඩ වර්ජන සැබවින් ම අතුරුදන් වී යාම යි. 1990 සහ 1999 අතර කාල පරිච්ඡේදයේ දී වර්ජනවල ප්‍රතිඵල වශයෙන් මිනිස් දින මිලියන හයක් වත් අහිමි වූ එක් වර්ෂයක් හෝ නො වී ය. එහෙත් දින මිලියන 17කට වැඩි සංඛ්‍යාවක අහිමිකල දිග් ගැසුනු නලුනිලි වැඩ වර්ජනයේ ප්‍රතිඵලයක් වශයෙන් අහිමි වූ මිනිස් දින ගනන මිලියන 20ක් වූ බැවින් 2000 වසර මීන් බැහැර විය. ඉන් අනතුරුව එලඹි වසරවල දී (2001-2008) දින 659,000ක් අහිමි වූ පහල මට්ටමක (2002 දී) සිට මිලියන 4ක් අහිමි වූ ඉහල මට්ටමක් (2003 දී) දක්වා දින සංඛ්‍යාව දෝලනය විය. 2004 පටන් වැඩ නැවැත්වීම් නිසා අහිමි වූ වාර්ෂික සාමාන්‍ය මිනිස් දින ගනන මිලියන 2ක් පමන විය.

සමාජ අසමානතාව දැවැන්තව වර්ධනය වීම, කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන් එක තැන පල් වීම සහ පිරිහීම, පෙර නොවූ විරූ දේශපාලන බලයක් පවත්වා ගෙන යන මූල්‍ය කතිපයාධිපත්‍යයක් මතු වී ඒම, ප්‍රජාතන්ත්‍රවාදය සෝදාපාලු වී යාම සහ අවසානයේ මිලිටරිවාදය වර්ධනය වීම තුලින් දක්ෂිනාංශික නිලධාරිවාදී කම්කරු සංවිධාන විසින් පන්ති අරගලය මර්දනය කිරීමේ ප්‍රතිවිපාක පෙන්නුම් කරයි. එක්සත් ජනපදය තුලත් ජාත්‍යන්තරවත් ආර්ථික වර්ධනය ප්‍රතිගාමී සහ සමාජමය වශයෙන් විනාශකාරී ස්වභාවයක් අත් කර ගත්තේ වෘත්තීය සමිති නිලධරයෙන් ලැබුනු අධිකතර සහ ක්‍රියාකාරී සහයෝගය නිසා ය.

කෙසේ වුව ද මෙය තනිකර ම ඇමරිකානු සංසිද්ධියක් නොවූ බව අවධාරනය කල යුතු ය. ඒ හා සමාන සමාජ ක්‍රියා දාම ජාත්‍යන්තර පරිමානයෙන් සිදු විය. කම්කරු නිලධරයන්ගේ පාවා දීම් නිසා 1968 සහ 1975 අතර කාල පරිච්ඡේදයෙහි පැන නැගි දැවැන්ත කම්කරු පන්ති නැගිටීමෙන් සිය පන රැක ගැනීමට ධනවාදය සමත් විය. ස්ටැලින්වාදී සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නිලධරයෝ තමන්ගේ පිලිවෙලට අනුව එක්සත් ජනපදයෙහි ධනවාදී ගැති කම්කරු නිලධරය ඉටු කල ප්‍රතිගාමී කාර්ය භාරයට දෙවන නොවන කාර්ය භාරයක් ඉටු කලහ. 1979 මැයි මාසයේ දී බ්‍රිතාන්‍යයෙහි මාගරට් තැචර් තේරී පත් වීම එක්සත් ජනපද නිදහස් වෙලඳ පොල ප්‍රතිපත්ති ද ඒ හා සමාන සමාජ ප්‍රතිවිපාක ද පිලිබිඹු කල ප්‍රතිපත්ති හඳුන්වා දීමට මග හෙලිපෙහෙලි කර දුන්නේ ය. එක්සත් ජනපදයේ දී සිදු වූවාක් මෙන් ම එහිදී ද කම්කරු පන්තිය දක්ෂිනාංශික ආන්ඩුවේ පිලිවෙත්වලට එරෙහිව පෑ විරුද්ධත්වය මර්දනය කිරීමේ දී කම්කරු නිලධරය තීරනාත්මක කාර්ය භාරයක් ඉටු කලහ.

එමෙන් ම පශ්චාත් යුද්ධ කාල පරිච්ඡේදයේ දී තමන් ආධිපත්‍යය දැරූ රටවල ධනවාදය යලි හඳුන්වා දීමට ස්ටැලින්වාදී තන්ත්‍රයන් ගත් තීන්දුව පසු ගිය 20 වසර තුල දී ගෝලීය දේශපාලනය සහ ආර්ථිකය කෙරෙහි දැවැන්ත බලපෑමක් අත් කර ගත්තේ ය. සෝවියට් සංගමය දිය කර හැරීම සහ නැගෙනහිර යුරෝපයට ධනවාදය යලි හඳුන්වා දීම එක්සත් ජනපදයට, යුරෝපා සහ ජපාන ධනවාදයට සූරා කෑම සඳහා අතිමහත් නව සම්පත් ප්‍රමානයක් විවර කර දුන්නේ ය. ආර්ථික වශයෙන් වඩාත් අර්ථභාරී කරුනක් වූයේ ස්ටැලින්වාදී පාලන තන්ත්‍රය චීනයට ධනවාදය යලි හඳුන්වා දීම යි. 1980 ගනන්වල දී චීනය අඩු වියදම් කාර්මික නිෂ්පාදනයේ ගෝලීය මධ්‍යස්ථානයක් බවට ආර්ථික වශයෙන් පරිවර්තනය වීමට පටන් ගැනින. මෙම ක්‍රියා දාමය සමාජ ගැටුමක් ජනනය කලේ ය. තරුන සිසුන්ගේ සහ කම්කරුවන්ගේ මහා විරෝධතාවන්ගෙන් 1989 දී කුලු ගැන්වුනේ එම ගැටුම යි. ස්ටැලින්වාදී පාලන තන්ත්‍රයේ දක්ෂිනාංශික පිලිවෙත්වලට එරෙහිව නැගුනු මහජන විරුද්ධත්වය මර්දනය කිරීමේ ක්‍රියා දාමයෙහි සන්ධිස්ථානය වූයේ 1989 ජූනි මාසයේ දී තියනන්මෙන් චතුරශ්‍රයෙහි සිදු වූ ජන සංහාරය යි.

දියුනු ධනපති රටවල සිදු වූ පන්ති අරගල මර්දනය කිරීමෙනුත් නැගෙනහිර යුරෝපයෙහි සහ චීනයෙහි ධනවාදය පුනස්ථාපනය වීමෙනුත් 1980 හා 1990 ගනන්වල දී සහ 21 වන සියවසේ පලමු දශකයේ දී නය මත පදදනම් වූ මූල්‍යකරන ව්‍යාපාරයේ දැවැන්ත වර්ධනයක් හා සම්බන්ධ වී ගත් පිලිවෙත්වලට වාසිදායක වාතාවරනයක් නිර්මානය විය. මෙය ප්‍රාග්ධනයේ අපරීක්ෂාකාරී සමපේක්ෂන ක්‍රියාකාරිත්වය කෙරෙහි පැවති සකලවිධ බාධාවන් — සමාජමය, දේශපාලනික, සහ නෛතික බාධාවන් පවා — මැඩ ලිය යුතු යැයි ඉල්ලා සිටි වාතාවරනයක් විය.

සමාජ සහ දේශපාලන ප්‍රතිගාමිත්වය දිග් ගැසී ගිය කාල පරිච්ඡේදයෙන් ඇඟවුනේ සමාජ සහ ආර්ථික ප්‍රතිවිරෝධතාවන් බලාත්කාරීව සහ කෘතීම මැඩ ලීම යි. ඉන් අනතුරුව එලඹෙන අර්බුදයේ බලපෑමත් තීව්‍රත්වයත් නිර්නය කෙරෙන්නේ මෙකී ප්‍රතිරෝධයන් මැඩලා ඇති තරමට ය. එබැවින් වත්මන් අර්බුදය පුපුරනසුලු සමාජ නැගිටීම් හටගන්වනු ඇතැයි අපේක්ෂා කල යුතු ය.

ඔබාමා පාලනාධිකාරයේ පලමු දින 100 ඇතුලත දී එහි ශක්තීන් කැප කර ඇත්තේ මූල්‍ය කතිපයාධිපත්‍යයේ ධන සම්පත් සහ ආසක්තතාවන් ආරක්ෂා කිරීම සඳහා ය. කොටස් වෙලඳ පොලේ මෑත කාලීනව සිදු වූ හදිසි නැග්මෙන් පිලිබිඹු වන්නේ ධවල මන්දිරය ගැන වෝල් වීදියට පවත්නා විශ්වාසය යි. භාන්ඩාගාර ලේකම් ටිම් ගයිත්නර් පාලනාධිකාරයේ ඇප දී ගලවා ගැනීමේ සැලැස්ම එලිදරව් කිරීමෙන් හා ඔබාමා මෝටර් රථ කර්මාන්තයෙහි දැවැන්ත ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය පලකිරීමෙන් පසුව එය තවදුරටත් ශක්තිමත් විය. බදු ගෙවන්නන් වෙතින් අරමුදල් සැපයුනු බැංකු ඇප දී ගලවා ගැනීමේ ක්‍රියාදාමයෙන් මූල්‍ය කතිපයාධිපත්‍යයට පැහැදිලි කෙරුනේ සිය ආසක්තතාවන් ආරක්ෂා කිරීම සඳහා කිසිදු අමතර වියදම් දැරීමක් අවශ්‍ය නැති බව යි.

මෝටර් රථ කර්මාන්තයේ අර්බුදයට ඔබාමා කල මැදිහත් වීමෙන්, වඩා පුලුල් මට්ටමකින් සිදු වූ ආර්ථික කඩා වැටීම, කම්කරු පන්තියේ වියදමෙන් එක්සත් ජනපදය තුල සමාජ සබඳතාවල බරපතල ප්‍රතිව්‍යුහගත කිරීමක් සඳහා ලද අවස්ථාවක් හැටියට පාලනාධිකාරයෙන් දැක ගත් බව ද පෙන්නුම් කෙරින. "කවදා වත් අර්බුදයක් අපතේ යන්න දෙන්න එපා" යි ඔබාමාගේ කාර්ය මන්ඩල ප්‍රධාන රාම් එමානුවෙල් කියද්දී ඔහු සිත තුල සැබවින් ම පැවති අදහස වුනේ එය යි. නිව් යෝක් ටයිම්ස් පුවත්පතේ ව්‍යාපාරික කටයුතු පිලිබඳ විශ්ලේෂක ෆ්ලොයිඩ් නොරිස් මැයි 2 වන දා ලියූ පරිදි:

මෙය ඔබාමා මහතාගේ "නික්සන් චීනයෙහි සිටින" මොහොත ලෙස වටහා ගැනෙන්නට ඉඩ ඇත. ලෝකයෙහි පවතින ලොකු ම කොමියුනිස්ට් රටත් සමග සබඳතා අරඹන්නට කොන්සර්වැටිව් රිපබ්ලිකානුවෙකු තෝරා ගැනෙද්දී යූඒඩබ්ලිව් සමිතිය බිඳින්නට ලිබරල් ඩිමොක්‍රැටිකයෙකු තෝරා ගැනුනා සේ ය.


සැබවින් ම මෙහි ලා පහත දැක්වෙන අනතුරු ඇඟවීම එක් කල යුතු යඃ ඔබාමාට යූඒඩබ්ලිව් සමිතිය අනිවාර්යයෙන් ම "බිඳ දැමීමට" සිදු වී තිබුනේ නැත. වචනයේ මොන යම් සාමාජීය සහ දේශපාලනික අරුත්බර අර්ථයකින් ගත්ත ද එය දිගු කලකට ඉහත දීම වෘත්තීය සමිතියක් ලෙස වූ සිය පැවැත්ම අවසන් කර දමා තිබින. යූඒඩබ්ලිව් වනාහි දැවැන්ත පාලනාධිකාරයක ආසක්තතාවන් සඳහා සේවය කරන සංවිධානයක් වන අතර ම සිය සංවිධානයේ සාමාජිකත්වය සමග පවත්වා ගෙන යන පරපුටු, සූරා කෑමේ සහ දෙපිටකාට්ටු සම්බන්ධතාවයකින් තම ආදායම් සරි කර ගන්නා සංවිධානයකි.

එක්සත් මෝටර් රථ කම්කරු සමිතියේ (යූඒඩබ්ලිව්) ජාත්‍යන්තර මූලස්ථානයෙහි පුද්ගලයෝ 2,000කට වඩා සේවය කරති. යූඒඩබ්ලිව් ජාත්‍යන්තරයේ සේවක ප්‍රකාශනය ලීගල් ප්‍රමානයේ පිටු 130කින් පමන සමන්විත ය. සමිතියේ නිල මූල්‍ය ප්‍රකාශනයට අනුව, 2008 වසරේ දී වැටුප්, දීමනා සහ වියදම්වල ස්වරූපයෙන් යූඒඩබ්ලිව්හි ජාත්‍යන්තර මූලස්ථානයේ කාර්ය මන්ඩලය වෙනුවෙන් කල මුලු වියපැහැදම ඩොලර් 101,896,200කි!

සේවකයන්ගෙන් බොහෝ දෙනෙකු "සේවා සැපයුම් නියෝජිතයන්," "සංවිධායකයන්," "ලඝු ලේඛකයන්" සහ "පරිපාලන සහායකයන්" ලෙස සේවය කරන්නන් ය. වෙනත් වචනවලින් කිව හොත් ඔවුන් දරන්නේ මුදුනෙහි සිටින සමිති විධායකයන්ට සහාය දෙනවාට වැඩි යමක් තමන්ගෙන් ඉටු විය යුතු නැති, වැඩ නැතිව පඩි ලබන නිලතල ය. කාර්ය මන්ඩලයෙන් හතරෙන් පංගුවක් පමන දලවශයෙන් වාර්ෂිකව ඩොලර් 110,000ක වැටුපක් ලබා ගනිති. " සේවා සැපයුම් නියෝජිතයන්" කිහිප සියයෙන් වැඩි දෙනෙකුට වාර්ෂිකව ඩොලර් 120,000ත් ඩොලර් 140,000ත් අතර වන වැටුප් සහ අමතර මුදල් ප්‍රමානයක් ගෙවනු ලැබේ. නියම "සේවා සැපයුම් නියෝජිතයෙකු" යනු සමිති සාමාජිකයන් කිහිප සියයකගේ කොන්ත්‍රාත්තු ගිවිසුම් අධීක්ෂනය සම්බන්ධයෙන් " වගකිව යුතු" සේ පෙනී යන, වෘත්තීය සමිති ප්‍රාදේශීය ශාඛාවකින් — කම්හල් වසා දැමීම් නිසා මේවා තව දුර නොපවතින්නටත් ඉඩ ඇත — අර්ධ වශයෙන් විශ්‍රාම ලත්, සිය ජීවිතයේ වයස 40 හෝ 50 ගනන්වල අග භාගය ගෙවමින් සිටින දක්ෂිනාංශික නිලධරයෙකි.

යූඒඩබ්ලිව් ජාත්‍යන්තරයේ කාර්ය මාන්ඩලිකයන්ගෙන් වැඩි දෙනෙක් ලේ නෑයෝ ය; එනිසා වෘත්තීය සමිතියෙන් කෙරෙන ගෙවීම්වලින් සමූහයක් හැටියට වාර්ෂිකව ඩොලර් 200,000කට වැඩි මුදලක් ලබා ගන්නා පවුල් හමු වීම අසාමාන්‍ය දෙයක් නො වේ.

යූඒඩබ්ලිව් සමිතියට සිය සාමාජිකත්වය දැවැන්ත ලෙස අහිමි වී ගිය ද එහි පාලනාධිකාරයේ මූල්‍යමය යහපැවැත්ම කෙරෙහි ඉන් කිසිදු අර්ථභාරී බලපෑමක් සිදු වී නැත. 2001 දී වෘත්තීය සමිතියට




*යූඒඩබ්ලිව් සමිතියේ මුලු සාමාජික සංඛ්‍යාව*

සාමාජිකයෝ 701,000ක් සිටියහ. එය සතුව තිබූ මුලු වත්කම් ප්‍රමාණය ඩොලර් බිලියන 1.1ක් යැයි තක්සේරු කෙරින. 2008 වන විට එහි සාමාජිකත්වය 431,000ක් දක්වා එනම් සියයට 40කින් පමන පහත වැටී තිබින.

කෙසේ වුව ද එම කාල පරිච්ඡේදය තුල දී ම යූඒඩබ්ලිව් සමිතිය සතු මුලු වත්කම් ප්‍රමානය ඩොලර් බිලියන 1.2 දක්වා ඉහල නැගින.


වත්කම් ප්‍රමානය ඉහල යාම යූඒඩබ්ලිව් පාලනාධිකාරයේ ආදායම සැලකිය යුතු මට්ටමකින් ඉහල දමා ගැනීමට හැකියාව ගෙන දී ඇත. 2000 දී ජාත්‍යන්තරය වැටුප් වශයෙන් සිය කාර්ය මන්ඩලයට ගෙවූ මුදල ඩොලර් මිලියන 89.6ක් විය. 2008 දී වැටුප් සඳහා ගෙවූ මුදල් ප්‍රමානය ඩොලර් මිලියන 100.9ක් දක්වා වර්ධනය වී තිබින. වෙනත් ආකාරයකින් මෙම සංඛ්‍යා පිරික්සා බැලීමෙන් පෙනී යන්නේ 2000 දී යූඒඩබ්ලිව්හි ප්‍රධාන නිලධරයන් එක් සමිති සාමාජිකයෙකු වෙනුවෙන් ඩොලර් 133ක ආදායමක් ලබා ගත් බව යි. යන්තම් වසර අටක් ගත වූ තැන දී ඔවුන් එක් සමිති සාමාජිකයෙකු වෙනුවෙන් ඩොලර් 233ක ආදායමක් ලබා ගත්තේ ය.

මෙම සංඛ්‍යා සමාලෝචනයට ලක් කරද්දී ඒවායින් ආවරනය වන්නේ යූඒඩබ්ලිව් ජාත්‍යන්තර මූලස්ථානයේ කාර්ය මන්ඩලය පමනක් බව සිහි තබා ගත යුතු ය. ගනිකා නිවාස වන් දැවැන්ත ප්‍රාදේශීය සමිති ශාඛා ජාලයේ සේවයේ නියුක්ත කරවා ඇති කාර්ය මාන්ඩලිකයෝ තවත් අමතර දසමිලියන ගනනක් කොටා ගනිති. ලෝකයෙහි පවත්නා විශාලතම සහ වඩාත් ම මිල අධික සංගත පාලිත කම්කරු-කලමනාකරන පොලිස් බලකායට වැටුප් සහ ප්‍රතිලාභ වශයෙන් සමූහිකව ඩොලර් බිලියන ගනනක් බෙදා ගන්නා යට කී ආකාරයෙන් ම ක්‍රියාත්මක වන වෙනත් "වෘත්තීය සමිති" සංවිධාන සිය ගනනක් ද පවතී.

ඔබාමා කල හැම දෙයක් ම කර ඇත්තේ යූඒඩබ්ලිව් සමිතියේ අනුමැතිය ඇතිව ය. ක්‍රයිස්ලර් සමාගම තමන් බංකොලොත් බව නිවේදනය කරන්නට පූර්වයෙන් එයත් යූඒඩබ්ලිව් සමිතියත් අතර ඇති කර ගැනුනු සමථ ගිවිසුමට පහත දැක්වෙන විධිවිධාන ඇතුලත් ය: 1) ජීවන වියදම් දීමනාව අත්හිටුවනු ලැබේ; 2) කලින් කතිකා කර ගැනුනු කාර්ය ප්‍රසාද දීමනා අත්හිටුවනු ලැබේ; 3) නත්තල් ප්‍රසාද දීමනා අත්හිටුවනු ලැබේ; 4) සේවකයන්ගේ සහන සේවා කාල සැලකිය යුතු මට්ටමකින් කපා හරිනු ලැබේ; 5) තාවකාලික පදනමෙන් සේවකයන් යොදා ගැනීම තව දුරටත් පුලුල් කරනු ලැබේ; 6) සියලු ආරාවුල් ඒකාබද්ධ බේරුම්කරනයට යටත් කරනු ලැබේ; 7) විශ්‍රාමිකයන්ට ගෙවන සෞඛ්‍ය දීමනා වහා ම කපා හරිනු ලැබේ.

ඔබාමා පාලනාධිකාරය සමග තමන්ට පවතින සමීප සම්බන්ධතා මගින් ක්‍රයිස්ලර් කම්කරුවන්ට සැලකිය යුතු ආරක්ෂාවක් සැපයෙනු ඇතැයි, ක්‍රයිස්ලර් සමාගම සිය බංකොලොත් භාවය නිවේදනය කිරීමෙන් පසුව, යූඒඩබ්ලිව් සමිතිය කියා සිටියේ ය. මෙය පචයකි. යලිදු නොරිස්ගෙන් ම උපුටා දක්වමු:

> විශ්‍රාමිකයන්ටත් වඩා නරක අන්දමින් ගිනුම්වලින් බැඳී සිටින්නවුන්ට සැලකීම මගින් පසු ගිය වසරේ මැතිවරනයේ දී ඔබාමා මහතාට ආධාර කල එක්සත් මෝටර් රථ කම්කරුවන්ට (යූඒඩබ්ලිව්) සාර්ථක ලෙස මුදල් ගෙවා ඍ කියාවලින් ඉවත් කල බව කියැවේ. මම මීට එකඟ නො වෙමි. ඇතැම් විට විශ්‍රාමිකයන්ට තමන්ට දෙන බවට පොරොන්දු වූ ප්‍රතිලාභ ලබා ගැනීමට යන්තමින් වඩා හොඳ




*යූඒඩබ්ලිව් ජාත්‍යන්තරය සතු මුලු වත්කම් ප්‍රමානය*


අවස්ථාවක් තිබුනත් දැනට සේවයේ යෙදී සිටින කම්කරුවෝ සිය සමහර රැකියා රැක ගැනීම සඳහා නියමිතවාට ටිකක් වැඩි යමක් ලබා ගනිමින් සිටිති.

මෙම දැවැන්ත ප්‍රහාරයන්හි දී යූඒඩබ්ලිව් සමිතිය විවෘතව ඒවාට සම්බන්ධ වීමෙන් මෝටර් රථ කම්කරුවන් අතර මෙම ප්‍රතිගාමී සංවිධානය කෙරෙහි පැවති විශ්වසනීයත්වයේ ඉතිරි වී තිබූ සොච්චම ද විනාශ වී ගොස් ඇත. මෙම සංවිධානය තමන් පාවා දී ඇති බව ඔවුහු වටහා ගනිති. කම්කරුවන් තමන්ගේ මූලික අයිතීන් සහ පන්ති ආසක්තතාවන් ආරක්ෂා කර ගැනීමට ගන්නා පියවරයන් යූඒඩබ්ලිව් සමිතියට සහ අන් සියලු සංගත ගැති සහ ධනවාදී ගැති සංවිධානවලට එරෙහි කැරැල්ලකට තුඩු දිය යුතු ය, තුඩු දෙනු ඇත. කම්කරුවන් ධනවාදී පද්ධතියට එරෙහි අරගලයට පිවිසීමත් සමග නව රූපාකාරවල පන්ති සංවිධාන මතු වනු ඇත.


පසු ගිය 20 වසර තුල දී වර්ජන සංඛ්‍යාවේ සහ වර්ජනවලට සම්බන්ධ වන කම්කරුවන් සංඛ්‍යාවේ සිදු වී ඇති අසාමාන්‍ය පිරිහීම ගැන අපි දැනට මත් සමාලෝචනය කොට ඇත්තෙමු. 1989 සහ 2009 අතර කාල පරිච්ඡේදයේ දී කාර්මික ගැටුම් නැත්තට ම පාහේ නැති වී යාමෙන් මෙම දශක දෙක පශ්චාත් සිවිල් යුද්ධ ඇමරිකාවෙහි අන් සියලු කාල පරිච්ඡේදවලින් වෙන් කෙරේ. 1870 සහ 1980 අතර පැවති සෑම දශකයක් ම පිලිබඳව කෙරෙන සමාලෝචනයකින් ඒ සෑම එකක් ම සැලකිය යුතු මට්ටම්වලින් කාර්මික පන්ති ගැටුම්වලට සාක්ෂ්‍ය දරන බව පෙන්නුම් කෙරෙනු ඇත. එහෙත් 1990 ගනන් සහ 2000 ගනන් තියුනු වෙනසකින් යුක්තව කැපී පෙනෙයි.

එහෙත් පසු ගිය දශක දෙකෙහි දක්නට ලැබෙන මෙම අක්‍රමවත් ස්වභාවය මෙම කාල පරිච්ඡේදයෙහි දක්නට ලැබෙන තවත් මූලික ලක්ෂනයක් සැලකිල්ලට ගනිමින් විශ්ලේෂනය කල යුතු ය; එනම් ඇමරිකානු පාලක පන්තියේ ධනවත් ම කොටස් අත ධනය සමුච්චගත වීමෙහි සිදුව ඇති විස්මය දනවනසුලු ඉහල යාම යි. 1947 දී ජනගහනයේ පොහොසත් ම සියයට .01 හිමිකම් කීවේ ජාතික ආදායමෙන් සියයට 1කට ය. මෙය වෝල් වීදියේ කඩා වැටීමට පූර්වයෙන් 1929 දී පැවති තත්ත්වය සමග සසඳන විට සැලකිය යුතු ලෙස අඩු ප්‍රතිශතයකි. එවිට එය ජාතික ආදායමෙන් සියයට 3.61කි. ඒ අතරතුර වසර ගනනාව ප්‍රචන්ඩ පන්ති ගැටුම්වලින් සහ කාර්මික සංවිධාන සම්මේලනය බිහි වීමෙන් සනිටුහන් විය. 1973 වන විට පොහොසත් ම සියයට .01හි ආදායම් පංගුව ජාතික ආදායමෙන් සියයට 0.6ක් දක්වා පහත වැටින. මෙම පහල අගය සියල්ලට මත් වඩා ඊට පූර්වයෙන් ගෙවී ගිය දශක දෙකහමාර තුල පන්ති ගැටුම් නිරන්තරව පැවති ඉහල මට්ටම් වල ප්‍රතිඵලයකි.

1979න් මෙපිට කාලයෙහි මෙම ක්‍රියා දාමය ප්‍රතිවිරුද්ධ දිසාවට එනම් පොහොසත් ම සියයට .01 අත (සහ ඇත්ත වශයෙන් කියතොත් ධනවත් ම සියයට 5 අත) ධනය කිසි දා නොවූ විරූ අයුරින් සංකේන්ද්‍රගත




*යූඒඩබ්ලිව් ජාත්‍යන්තරයේ කාර්ය මාන්ඩලික ආදායම*




*ඉහල ම .01%හි (සියයට එකෙන් සියයෙන් එකෙහි) ආදායම් පංගුව*

වීමක් දෙසට චලනය වන්නට පටන් ගත්තේ ය. ඒ අවුරුද්දේ දී පොහොසත් ම සියයට .01 ජාතික ආදායමෙන් 0.9ක් පොදි ගසා ගත්හ. 1989 වන විට එහි ආදායම් පංගුව සියයට 2.3ට නැගී තිබින. 1999 වන විට ඉහල ම ස්තරයේ ආදායම් පංගුව සියයට 2.92ට ලගා විය. 2006 එනම් අප සතුව (පිකෙටි සහ සායෙස් යන මහාචාර්යවරුන්ගේ අධ්‍යයනයන් පදනම් කර ගත්) සංඛ්‍යා ඇති අවසන් වසර වන විට, පොහොසත් ම ඇමරිකානුවන්ගේ ආදායම් පංගුව සියයට 3.76ට ලගා වී තිබින.


දැන් අප ජනගහනයේ ඉහල ම සියයට 0.1 (සියයට එකෙන් දහයෙන් එකෙහි) ආදායම් පංගුව විභාග කරන්නේ නම් 1929 දී මෙම ස්තරය ජාතික ආදායමෙන් සියයට 8.7ක් පොදි ගසා ගත්හ. 1947 වන විට එහි පංගුව සියයට 3.4 දක්වා පහත වැටී තිබින. 1973 පැවති පහල ම ලක්ෂ්‍යයේ දී එහි ආදායම් පංගුව සියයට 2.2ට පිරිහී තිබින. 1979 දී එය සියයට 2.7 දක්වා ද 1989 දී එහි පංගුව සියයට 5.5 දක්වා ද වැඩිවිය. 1999 වන විට එය සියයට 8ට ලගා වී තිබින. 2006 දී ඉහල ම සියයට 0.1හි ආදායම් පංගුව පැවතුනේ සියයට 9.1හි ය.

අවසන් වශයෙන් අපි ඉහල ම සියයට 1ට ඇතුලත් වූවන්ගේ ආදායම පිරික්සා බලමු. 1929 දී මෙම ස්තරය ජාතික ආදායමෙන් සියයට 19.8ක් ලබා ගත්හ. 1947 දී එහි පංගුව සියයට 11.25ට පහත වැටින. 1973 දී එනම් පහල ම ලක්ෂ්‍යයේ දී ජාතික ආදායමෙන් එහි පංගුව සියයට 8.3ක් දක්වා වැටී ගියේය. 1979 දී එය සියයට 9 දක්වා තරමක් ඉහල ගිය අතර 1999 දී එය සියයට 18.4ක් දක්වා දෙගුනයකටත් වඩා ඉහල ගියේ ය. 2006 දී එය පැවතුනේ සියයට 20හි ය. එනම් ජනගහනයේ පොහොසත් ම සියයට එක ජාතික ආදායමෙන් පහෙන් එකක් ලබා ගත්හ.




*පොහොසත් ම සියයට 1හි ආදායම් පංගුව*

අපි 1947 සහ 2006 අතර කාලයෙහි ධනපති පන්තියේ ධනවත් ම කොටසේ ආදායම් පංගුව ප්‍රස්තාරගත කරන විට එය එම කාල පරිච්ඡේදය අතරතුර දී සිදු වූ වර්ජන මට්ටම් පිලිබඳ ප්‍රස්තාරය මත අධිස්ථාපනය වේ; මෙම විචල්‍යයන් අතර පවත්නා සබඳතාව සුවිශද ලෙස සන්නිදර්ශනාත්මකව පැහැදිලි වේ. වැඩ පොල සටන්කාමිත්වයේ ද විවෘත පන්ති ගැටුමේ ද ඉහල මට්ටම් පොහොසතුන් අතර ධනය සමුච්චගත වීමේ ද සමාජ අසමානතාවේ ද පහත වැටීමක් සමග සම්බන්ධ ය. සමාජ ගැටුම යටපත් කෙරුනු කොන්දේසි යටතේ සමාජ



*ඉහල ම .1%හි (සියයට එකෙන් දහයෙන් එකෙහි) ආදායම් පංගුව*

අසමානතාවේ මට්ටමත් සමග එක පෙලට සිටිමින් ධනය සමුච්චගත වීම වේගයෙන් වර්ධනය විය. මෙම සම්බන්ධිත සංසිද්ධීන්හි ප්‍රස්තාරය පෙන්නුම් කරන පරිදි පොහොසත් ම සියයට .1 අත ධනය සමුච්චගත වීම සහ වර්ජන ක්‍රියාකාරකම්වල මට්ටම පිලිබිඹු කරන රේඛා අතර පරතරය පසු ගිය 20 වසර අතරතුර දී විස්මය දනවනසුලු ලෙස වර්ධනය වී ඇත.




*1948-2006 අතර කාලය තුල වර්ජන මට්ටම් සහ ධනය සංකේන්ද්‍රගත වීම අතර සහසම්බන්ධය*

*පොහොසත් ම සියයට 1හි ආදායම් පංගුව*

*වැඩ වර්ජනයන්හිදී අහිමිවූ වැඩ කාලය ප්‍රතිශතයක් ලෙස*

විභව "ගැටුම් කලාපයක්" යැයි නිර්වචනය කල හැකි මෙම පරතරය සමාජ "සාමය" සමග නොගැලපෙන මානයන්ට ලඟා වී ඇත. එක්සත් ජනපදයේ සමාජ අසමානතාව දැන් මහා අවපාතයට සහ ඉන් පසුව ඇති වූ කම්කරු පන්ති සමාජ නැගිටීමට පූර්වයෙන් 1929 දී එය සිටි තැනට ආ පස්සට යමින් සිටී. සමාජ ගැටුම යටපත් කිරීමට ඔබාමා පාලනාධිකාරයට සහ වෘත්තීය සමිති සංවිධානයට පවතින හැකියාව සීමා කරන සාධක පවතී. එක්සත් ජනපදයේ සමාජ ප්‍රතිවිරෝධතා පන්ති අරගලයේ පුපුරනසුලු මට්ටමේ යලි අලුත් වීමක් ඇති වීම නොවැලැක්විය හැකි තැනකට ලඟා වී ඇත.

එහෙත් එලඹෙන අරගලයන් හුදෙක් අතීත රටාවන්ගේ පුනර්කරනයක් වනු නැත. වසර ආරම්භයේ දී සසපය මෙසේ කියා සිටියේ යː

> සසපයේ කර්තව්‍යයන් ගලා එන්නේ ඇමරිකානු සහ ලෝක ධනවාදයේ සමාජ-ආර්ථික සහ දේශපාලන අර්බුදයේ තර්කනයෙනි. ගැඹුරු වෙමින් පවතින්නා වූ ලෝක අර්බුදය එක්සත් ජනපදයේ ද ජාත්‍යන්තරව ද කම්කරු පන්තිය සමාජ හා දේශපාලන වශයෙන් රැඩිකලීකරනය වීමකට මග පාදතැයි පක්ෂය විශ්වාස කරයි. වෘත්තීය සමිතිවල නිලධාරිවාදී ප්‍රතිගාමී විලංගුවලින් බිඳී නිදහස් වීමට පරිශ්‍රම දරමින් වඩ වඩාත් දේශපාලනික හා ධනේශ්වර විරෝධී වූ මානයන් අත් කර ගන්නා මහා ජන අරගල වර්ධනය වී ඒමෙන් මෙම රැඩිකලීකරනය ප්‍රකාශයට පත් වනු ඇත.

ඉතිහාසය යලිත් වරක් තියුනු හැරීමක් ගෙන ඇත. ගත වූ මාස දොලහ වෛෂයික තත්ත්වයේ අතිශය අසාමාන්‍ය වූ ප්‍රතිවර්තනයක් අත්දුටුවේ ය. මානව වර්ගයා, සිය සංහතියේ ඉරනම තීන්දු කරනු ඇති ලෝක පරිමානව පැන නැගෙමින් තිබෙන දේශපාලන කැලඹීම්වල ද සමාජ අරගලයන්ගේ ද නව කාල පරිච්ඡේදයකට පිවිසෙමින් සිටී. ලෝක සමාජවාදී විප්ලවය සඳහා වූ වෛෂයික පූර්වාවශ්‍යතා සීමාන්තික වේගයකින් පෙරට එමින් පවතී. එහෙයින් ආත්මීය සාධකයේ එනම් විප්ලවවදී පක්ෂයේ භූමිකාව තීරනාත්මක ඓතිහාසික අර්ථභාරයක් අත් කර ගනී. වෛෂයික තත්වයේ මුහුකුරා යාම සහ කම්කරු පන්තියේ පවත්නා විඥ්ඥානය අතර පවත්නා අගාධය තරනය කල යුතු ය. අන් සියල්ලට මත් වඩා මෙයින් ඉල්ලා සිටින්නේ සසපයට කම්කරුවන් හා තරුනයන් බඳවා ගැනීම ද මාක්ස්වාදී න්‍යායේ සහ හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසයේ පදනම මත ඔවුන් දේශපාලනිකව උගන්වා ගැනීම ද වේ. 2009

වර්ෂයේ දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ද සමාජවාදී සමානතා පක්ෂය ද තමන්ගේ සකල ප්‍රයත්නයන් ම යොමු කල යුත්තේ මෙම කටයුත්තට ය.

පසු ගිය මාස පහ තුල දී මෙම විශ්ලේෂනය සහ ඉදිරි දර්ශනය සංශෝධනය කල යුතු යැයි විශ්වාස කිරීමට අප යොමු කරන කිසිවක් සිදු වී නැත. ඒ වෙනුවට මූල්‍ය කතිපයාධිපත්‍යයේ ආසක්තතාවන්ට සරිලන පරිදි අර්බුදය විසඳීමට ඔබාමා පාලනාධිකාරය මුලු හිතින් සහ අනුකම්පා විරහිතව දරන ප්‍රයත්නයන් පන්ති ආතතීන් අවුලුවනු ඇත. විවෘත පන්ති ගැටුම යලි පන ගැන්වී ගැනීමෙන් ඇති විය හැකි ක්ෂනික ආවේගය කුමක් වුවත් අවසන් විග්‍රහයේ දී එහි රූපාකාරය, ස්වභාවය සහ අරමුනු නිර්නය වනු ඇත්තේ ඇමරිකානු සහ ලෝක ධනවාදයේ අර්බුදයේ උච්ච අදියරෙනි. මතු වෙමින් පවතින ජාත්‍යන්තර කම්කරු පන්ති ව්‍යාපාරයේ කොටසක් ලෙස දිග හැරෙන ඇමරිකානු කම්කරු පන්තියේ එලඹෙමින් ඇති අරගල සමාජවාදය සඳහා වූ දේශපාලන අරගලයක රූපාකාරය අත් කර ගනු ඇත.

© www.wsws.org